# <u>අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය</u>

මාධ්‍ය නිවේදනය

2019 මාර්තු 11

## <u>අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඉදිරිපත් කළ අතුරු සහන යෝජනා 2019 අයවැයෙහි අන්තර්ගත වීම සාදරයෙන් පිළිගනිමු</u>

ක්‍රියාන්විතයේ නිරතව සිටියදී අතුරුදහන් වූ හමුදා හා පොලීස් නිලධාරීන් ඇතුළු අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් වල සාමාජිකයන් හට රු 6,000 බැගින් මාසික දීමනාවක් ලබාදීම සඳහා රු. මිලියන 500 ක මුදලක් 2019 අයවැයෙන් වෙන් කිරීමට රජය විසින් පසුගිය 2019 මාර්තු 05 වැනිදා යෝජනා කරන ලදී. අයවැයෙන් යෝජනා වූ පරිදි, හානිපූරණය සඳහා වූ කාර්යාලය විසින් ඔවුන්ගේ හිමිකම් විසඳන තෙක් මෙම මාසික දීමනාව දක්නට නොමැති බවට සහතිකයක් (Certificate of Absence) ලබා ගත් පවුල් සඳහා ලබා දෙනු ඇත. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් 2018 අගෝස්තු මස රජය වෙත නිර්දේශ කරන ලද අතුරු වාර්තාවේ අඩංගු මෙම කරුණ 2019 අයවැය යෝජනාවක් ලෙස ඉදිරිපත් වීම අපි සාදරයෙන් පිළිගනිමු. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමටත් මෙහි ව්‍යාප්තිය වැඩි කරමින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් තවත් දහස් ගණනකට මෙම සහනය සඳහා අවස්ථාව සැලස්වීමට සහය ලබාදීමටත් කැප වී සිටිමු.

ස්ථිර ආදායමක් නොමැති ව සහ වෙනත් දුෂ්කරතාවන්ට මුහුණ දෙමින් ජීවත්වන අතුරුදහන් වූ පුද්ගලයාගේ කාලත්‍රයාහට, දරුවා/දරුවන් හට සහ/හෝ අතුරුදහන් වූ පුද්ගලයාගේ දැනට ජීවතුන් අතර සිටින මව/පියා/දෙමාපියන් හට රු 6000ක මාසික ජීවන දීමනාවක් ලබාදීම සඳහා මූල්‍යාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාවෙන් නිර්දේශ කර තිබිණි (පරිච්ඡේදය 45 (අ), අතුරු වාර්තාව).

මෙම මාසික සහන දීමනාව දක්නට නොමැති බවට සහතිකයක් ලබාගැනීම සමඟ සම්බන්ධකර තිබීම ගැටලු සහගත තත්ත්වයක් නිර්මාණය කිරීමට තුඩුදිය හැකි බව අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අවධානයට ලක් ව ඇත. දක්නට නොමැති බවට සහතිකයක් ලබාදීම සඳහා පහසුකම් සැලැසීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වශයෙන් අප නීතිමය වගකීමක් දරන්නෙමු.

මේ සම්බන්ධයෙන් දැනුවත්භාවය වැඩි කිරීමටත් ඒ ඉල්ලුම් කිරීම් සඳහා සහය සැලයීමටත් අවශ්‍ය ක්‍රම සම්පාදනය දැනට සිදු කෙරෙමින් පවතියි. පවුල් විසින් මෙම සහතිකය ලබාගැනීමට ඉදිරිපත් නොවීමට ඇති අභියෝග හඳුනාගනිමින් එම අභියෝගවලට මුහුණ දීම සඳහා සහතික ලබා ගැනීමේදී ඔවුන් මුහුණ දෙන ප්‍රායෝගික ගැටලු හඳුනාගනිමින් ඒවාට විසඳුම් ලබාදීම සඳහා දැනටමත් ප්‍රයත්න දරමින් සිටිමු. දක්නට නොමැති බවට

සහතික දැනට ලබාගෙන ඇත්තේ සුළු පිරිසකි. රජය සමග එක් වී සහන ලබා දීම පුළුල් කිරීම සඳහා පියවර ගැනීමට අවශ්‍ය වන ලියවිලි හා අනන්‍යතාවය තහවුරු කරගැනීමේ ක්‍රමවේදයන් කාර්යක්ෂම කිරීමට ද අපි බලාපොරොත්තු වෙමු.

තවද, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අතුරු සහන ලෙස ණය සහන, නිවාස, අධ්‍යාපනය, වෘත්තීය පුහුණුව, ජීවනෝපාය සංවර්ධනය සහ රැකියා නියුක්තිය ඇතුළු තවත් නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කර ඇත. එවන් එක් නිර්දේශයක් වන්නේ අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් 'එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා' වැනි මූල්‍යාධාර වැඩසටහන් සහ ණය යෝජනා ක්‍රම සඳහා ඇතුළත් කිරීම තුළින් එම පවුල්වලට ආර්ථික නිදහස ළඟා කරගැනීම සඳහා අවශ්‍ය සහය සැපයීමයි (පරිච්ඡේද 45 (ආ), අතුරු වාර්තාව). අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට 'එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා' ණය යෝජනා ක්‍රමය හරහා ණය ලබාදීමේදී ප්‍රමුඛත්වයක් ලබාදීමට 2019 අයවැයේදී රජය ගත් තීරණය අපි සාදරයෙන් පිළිගනිමු. අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්, ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය විසින් සම්බන්ධීකරණය කරන ජීවනෝපාය සංවර්ධනය කිරීමේ වැඩටසහනක් හා සම්බන්ධ වීම අවශ්‍ය වේ. 2018 අගෝස්තු මාසයේදී, අතුරු වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතුරු සහන සහ යුක්තිය සඳහා කළ නිර්දේශ පිළිබඳ නැවත සොයාබැලීමක් සිදු කරන ලද අතර ඒවා නිසිලෙස ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීම සඳහා රජයේ විවිධ ආයතන සමඟ ඉදිරියේදී ද සම්බන්ධ වී කටයුතු කරනු ඇත.

2016 අංක 14 දරණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතු කාර්යභාරයක් නම් පරිපාලන සහය සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන් හට සුබසාධන සේවා සැපයීම හෝ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමයි (වගන්තිය 13 (1) (ඉ). ඇතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් අත්විඳින ආර්ථික අපහසුතා ද ඔවුන් මුහුණ දුන්නා වූ පීඩාකාරී තත්ත්වයන් ද අවබෝධ කරගෙන, ඔවුන්ගේ සංකීර්ණ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා වන්දි සහ වෙනත් ආකාරයේ හානිපූරණ ලබා දෙන තෙක් මෙම පවුල් අතරින් දැඩි ආර්ථික හා සමාජ තත්ත්වයන්ට මුහුණ දෙන පවුල් සඳහා අතුරු සහන සැලසීම අතිශයින් වැදගත් බව අතුරුදන් වූ තැනැත්තන්ගේ කාර්යාලය හඳුනාගෙන තිබේ. මෙම සහන ලබා ගැනීම, නිසි ප්‍රමාණවත් ඵලදායී හානිපූර්යණයක් සඳහා වන අයිතිවාසිකම කිසිසේත්ම අහිමි නොකරන අතර, අධිකරණමය ප්‍රතිකර්මයන් මගින් වගවීමට ලක් කිරීමට ඇති අයිතියට කිසිඳු සීමාකිරීමක් ඇති නොකරයි (පරිච්ඡේද 44, අතුරු වාර්තාව). පනත ප්‍රකාරව ඇති කාර්යභාරය සම්පූර්ණ කිරීම වෙනුවෙන් පෙනීසිටින බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තවදුරටත් අවධාරණය කර සිටියි.